ද මැසිනොද් විදුහල - කඳාන
De Mazenod College – Kandana

1-08-2019

දෙවන වාර ඇගයීම : 2019

10 ශ්‍රේණිය **නර්තනය** කාලය : පැය 02

නම : ............................................ පංති අංකය : ........

අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඔබට සපයා ඇති කවය තුළ ( X ) යොදන්න.

01. බිම් සකස් කිරීම, පැළ සිටවීම, පැළ නඩත්තු කිරීම, අසවනු නෙළීම, අළෙවිය සඳහා නර්තන නිර්මාණයක් කළ හැකි නිවැරදි ජීවන වෘත්තිය වනුයේ,

1. තේ කර්මාන්තයි.
2. ධීවර කර්මාන්තයි.
3. කෘෂි කර්මාන්තයි.
4. කොහු කර්මාන්තයි.

02. "අතකට ගෙන රබන් පොඩිය" මෙහි ඇතුළත් ලඝු ගුරු මාත්‍රා සංඛ්‍යාව වනුයේ,

1. 12 කි.
2. 10 කි.
3. 8 කි.
4. 16 කි.

03. නර්තනයේ දී රාජසභා ලක්ෂණ ගන්නා නැටුමක් වනුයේ,

1. සවරං නැටුම ය.
2. සවරං නැටුම ය.
3. ගොයම් නැටුම ය.
4. මෝල්ගස් නැටුම ය.

04. උඩරට සම්ප්‍රදායේ ගොඩ සරඹ මෙන් පහතරට සහ සබරගමු සම්ප්‍රදායන් නොව,

1. ඉලංගම් සරඹ - මණ්ඩිපද යනුවෙනි.
2. මණ්ඩිපද - දොම්න පද යනුවෙනි.
3. ඉලංගම් සරඹ - දොම්නපද යනුවනි.
4. ඉරට්ටිය - දොම්න පද යනුවෙනි.

05. තත් තත් තක්කඩ කඩතක . . . . කස්තිරම අදාළ ගොඩ සරඹ පදය වනුයේ,

1. අර්ධ චක්‍ර සරඹයයි.
2. චන්ද්‍රිකා සරඹයයි.
3. පැනීම් සරඹයයි,
4. බඹර සරඹයයි.

06. සුළු මහ දෙතිතට . . . . . . . . , බෙර පදය වාදනය කළ හැකි ය.

1. දොං පිංත ගත දොංත
2. දොං පිංපිං - තකට දොංතක
3. දොං දොංපිං පිං ගජිගත
4. දොදොංත - තකුදොං



Learning Resource Center
R
De Mazenod College
Kandana

07. ඇරත් මෙහෙම යස වැඩක් උනේ නැත. මෙහි ඉතිරි පදය වන්නේ කුමක් ද?

1. හටත් මෙලෙසවෙයි කැටත් තබමි දඩ
2. විරත් කලෙක පැවතුමත් යසයි හැඩ
3. රටක් වටින සිහ රජ වන්නමේ වැඩ
4. ලිඳක් තුළෙක ඉබි ලඩෙක් කරපු වැඩ

08. තකට කුඳට යනු,

1. ගැටබෙරයෙන් වාදනය කරන බෙර පදයකි.
2. ගැටබෙරයෙන් වාදනය කරන බෙර සරඹයකි.
3. ගැටබෙරයේ බෙර පෙරළුම් පදයකි.
4. යක් බෙරයෙන් උපදින සතර බීජාක්ෂරයකි.

09. බෙර වාදනය පුහුණු වීමේ දී පළමුව පුහුණු විය යුත්තේ,

1. සරළ බෙර පදයයි.
2. අලංකාර බෙර පදයයි.
3. බෙර සරඹ පදයයි.
4. බෙර පෙරළුම් පදයයි.

10. එකිනෙකාගේ මනෝභාවයන් තුළින් සහයෝගය පෙන්නුම් කරන මුද්‍රා නාට්‍ය වනුයේ,

1. කරදිය මුද්‍රා නාට්‍යයයි.
2. හංසවිල මුද්‍රා නාට්‍යයයි.
3. දෙපානෝ මුද්‍රා නාට්‍යයයි.
4. කුඹි කථාව මුද්‍රා නාට්‍යයයි.

**අංක 11 සිට 15 දක්වා පහත සඳහන් වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | I තීරුව | II තීරුව | III තීරුව | IV තීරුව |
|---|---|---|---|---|
| A | හටනාලාව | හක් ගෙඩිය | දෙපැති අඩිය | අවුල් හැරය |
| B | තුරඟා වන්නම | සිංහරාජ වන්නම | සැවුලා වන්නම | හොරණෑව |
| C | මළබෙර | නායියඩි වන්නම | අණබෙර | වද බෙර |
| D | ශිඛාබන්ධනය | හනුමා වන්නම | උරබාහු | පසු පෙර අඩිය |

11. කරුණා රසය නිකුත් කිරීම සිදුවන්නේ කුමන වාදනයන්ගෙන් ද?

1. A පේළියේ I තීරුවෙනි.
2. C පේළියේ III තීරුවෙනි.
3. C පේළියේ I හා IV තීරුවෙනි.
4. A පේළියේ I හා II තීරුවෙනි.

12. සන්නිවේදන කටයුතු සඳහා බෙරය යොදාගත් අවස්ථාවකි.

1. C පේළියේ IV තීරුවේ ය.
2. C පේළියේ III තීරුවේ ය.
3. C පේළියේ I තීරුවේ ය.
4. C පේළියේ I , III, IV තීරුවේ ය.

13. හේවිසි හා තේමා වාදනයේ දී යොදා ගන්නා සුෂිර භාණ්ඩයකි.

1. A පේළියේ I තීරුව
2. A පේළියේ II තීරුව
3. A පේළියේ I හා II තීරුව
4. B පේළියේ IV තීරුව

14. කුඳ ගජිගත කුඳ ගජිගත කුඳ තා. . . . මෙම කස්තිරම නටනු ලබන වන්නම සඳහන් වනුයේ,

1. B පේළියේ III තීරුවේ ය.
2. B පේළියේ I තීරුවේ ය.
3. D පේළියේ II තීරුවේ ය.
4. B පේළියේ II තීරුවේ ය.

15. වෙස් නැටුම් ශිල්පියා සිරස මත පළඳන ආභරණය වනුයේ,

1. D පේළියේ III තීරුව
2. D පේළියේ I තීරුව
3. A පේළියේ I හා II තීරුව
4. A පේළියේ IV තීරුව

**නිවැරදි පිළිතුර තෝරන්න.**

16. තාල තැබීමේ දී තාල ස්ථාන දැක්වීම . . . . . . . . නම් වේ.

1. ආතත
2. විතත
3. ආඝාත
4. අනාඝාත

17. ආඝාතාත්මක හා අනාඝාතාත්මක යන ලක්ෂණ දෙකම එකවර යෙදෙන ගායනා විශේෂය වනුයේ,

1. සටන් කවි ය.
2. පාරු කවි ය.
3. කරත්ත කවි ය.
4. ටීකා කවි ය.

18. සොඬක බෙරයට කියන තවත් නමකි.

1. දිග් බෙරය
2. ගැට බෙරය
3. මඟුල් බෙරය
4. දවුල් බෙරය

19. ගැට බෙර කඳෙහි දිග ප්‍රමාණය වනුයේ,

1. තුන් වියතකි.
2. තුන් වියත් තුනඟලකි.
3. එක් වියත් තුනඟලකි.
4. තුන් වියත් දැඟලකි.

01-08-2019
10 ශ්‍රේණිය
නර්තනය

20. උඩරට වන්නම් දහඅටට අයත් වන්නමකි,
   1. අනිලා  2. ගජබා
   3. සිංහනාඩි  4. සිංහරාජ

21. උඩරට නර්තනයට ආවේනික වූ රංග වස්ත්‍රාභරණයකි,
   1. කාඟුල්  2. අවුල් හැරය
   3. නළල් පටි  4. රඟු

22. හත් පදයට අයත් නර්තනාංගයකි,
   1. දළුමුර පදය  2. තැඹිලි පදය
   3. හමාර පදය  4. කොතල පදය

23. සශ්‍රීකත්වය, පූජාර්ථය, සෞභාග්‍ය උදාකර ගැනීම සඳහා පවත්වනු ලබන ගැමි නාටකයයි,
   1. සොකරි  2. කෝලම්
   3. නාඩගම්  4. රූකඩ

24. විස්මය නැමති ස්ථායි භාවයෙන් . . . . . . උපදී,
   1. හාස්‍ය රසය  2. ශාන්ත රසය
   3. භයානක රසය  4. අද්භූත රසය

25. ගොඩ සරඹ 9 හා 11 පදවල සරඹ නාමය වනුයේ,
   1. බඹර හරඹය හා ස්ථිත පැගීම
   2. චන්ද්‍රිකා හරඹය හා පැනීම් හරඹය
   3. දැත පැගීම හා පැනීම් හරඹය
   4. බඹර හරඹය හා පැනීම් හරඹය

26. මාත්‍රා 2 + 3 දෙතිතට නටනු ලබන වට්ටම වනුයේ,
   1. දොං ජිංජිං තකට දොංතක වට්ටම ය.
   2. දොං ජිංත ගත දොංත වට්ටම ය.
   3. දොං දොංජිං ජාං ගජිගත වට්ටම ය.
   4. දොං දොංජිං තක් කඩතක වට්ටම ය.

27. සුරත් තට්ටුව යනු,
   1. ගැටබෙරයේ මූලික අක්ෂර කොටසකි.
   2. වෙස් ඇඳුම් කට්ටලයේ කොටසකි.
   3. ගැටබෙරයේ හුරු ඇසෙහි ආරක්ෂක වැස්මකි.
   4. අභිනයේ කොටසකි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

28. . . . . . . මෙම කවිය මාත්‍රා 3 + 4 දෙකිතේ තාල රූපයට ගායනා කළ හැකි ය.

1. සොබමන් දෙවිවරු
2. යනෙන කළු ගඟ එතෙර
3. නන් උතුම් පෙම්බර ගුණ
4. පුරවර මැද බැඳි

29. ලය ප්‍රභේද තුනකි. ඒවා නම්,

1. විලම්භ, මධ්‍ය, ද්‍රැත ය.
2. පුළු, මැදුම්, මහ ය.
3. තනි තිත, දෙතිත, තුන් තිත ය.
4. පෙර තිත, පසු තිත, මධ්‍ය තිත ය.

30. ප්‍රස්තාරයේ මූලධර්ම වලට අනුව මාත්‍රා හතරේ තනි තිත දැක්විය හැකි වඩාත් නිවැරදි සංකේතය වන්නේ,

1. ∧ /
2. ∧ ∧ /
3. /
4. ∧ ∧ ∧ /

31. නර්තන කලාවේ උන්නතිය උදෙසා පොළොන්නරු යුගයේ රජ කළ මහා පරාක්‍රමබාහු රජතුමා විසින් . . . . . . ඉදි කරන ලදී.

1. වටදාගෙය
2. කුට්ටම් පොකුණ
3. කවිකාර මඩුව
4. සරස්වතී මණ්ඩපය

32. නර්තන ශිල්පියෙකු නර්තනය ආරම්භයේ දී . . . . . සිදු කරනු ලැබේ.

1. ආරම්භක පදය
2. නමස්කාර හරඹය
3. හමාර පදය
4. පා සරඹ

33. ගැටබෙරයේ කොටස් අතුළත් වරණය තෝරන්න.

1. හැක්ම, කන්වරය, හයි තට්ටුව
2. බෙර පුහුල, වරපටි, ඉල්ලම් මුදු
3. හයි තට්ටුව, සුරත් තට්ටුව, කැපුම් හම
4. බෙර පුහුල, සුරත් තට්ටුව, කැපුම් හම

34. කොහොඹා කංකාරි ශාන්තිකර්මය හා සම්බන්ධ මූලික චාරිත්‍ර විධි කීපයකි.

1. කප් සිට්වීම, මඩු පේ කිරීම, තොට පේ කිරීම.
2. කප් සිට්වීම, තොටමෙට යාම, මඩු පේ කිරීම.
3. කප් සිට්වීම, මඩු පේ කිරීම, මිල්ල කැපීම.
4. කප් සිට්වීම, මිල්ල කැපීම, බිසෝ කප් සිටුවීම.

පහත දැක්වෙන කවිය ඇසුරින් 35 සිට 39 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගසමින් කග පතින් දෙපලුව අසුරසෙන්
දරුපා අතළුවෙන් පලු දෙක ගෙන සැනකින්

35. ඉහත කවිය අයත් වන්නම වන්නේ,

1. සිංහරාජ වන්නම
2. නෛයඩි වන්නම
3. වෛරෝඩි වන්නම
4. සැවුලා වන්නම

36. ඉහත කවිය ගායනය කළ යුතු තාල රූපය වන්නේ,

1. 1 2 3 4 / 1 2 3 4
2. 1 2 / 1 2 3 4
3. 1 2 / 1 2 3
4. 1 2 3 / 1 2 3 4

37. ඉහත වන්නමට නියමිත කස්තිරම ආරම්භ වන්නේ,

1. කුඳ ගජිගත /// කුඳ තා යනුවෙනි.
2. තකට තකට තක තරිකිට කුංදත් යනුවෙනි.
3. රුංතක ජිංතක තරිකිට කුංදත් යනුවෙනි.
4. රුඳග ජිත් තක තකට කුංදත් යනුවෙනි.

38. ඉහත කවියේ මීළඟ පදය වන්නේ,

1. අසුරන් කළ යුදෙන් ජය ගෙන කඳ කුමරුන්
2. දිගා සිරුර කොටසක් හකුළා මුබ
3. එම වන් පලුවකින් එළපත් සැනයකින්
4. බර අත් ගෙන කගින් ඇන කොත්තවී වලින්

39. ඉහත වන්නමට අයත් බෙර පදය වන්නේ,

1. දොං දොං ජිං ජිං ගජිගත
2. කුඳ ගත ගත දොං
3. දොම් කිට කිට දොම්
4. ජිංගත ගො ගො

40. කොහොඹා කංකාරියට අයත් චාරිත්‍ර විධි දෙකකි.

1. කප් ගස් බැඳීම හා පූනාව පේ කිරීම.
2. ගුරුගේ මාලාව හා තොට පේ කිරීම.
3. මඩු පේ කිරීම හා යක් ඇන්නුම.
4. කප් සිටුවීම හා මගුල් බෙර.